119

වගා දිරි දීමනා චක්‍රලේඛ අංක : 54

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක. 70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
1999.05.22 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,
සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන්,
ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරීන්,
අධීක්ෂණ තේ පරීක්ෂක/ ව්‍යාප්ති නිලධාරීන්

## වගා දිරි දීමනා ක්ෂෙත්‍ර හරස් පරීක්ෂණ

මෙහෙයුම් කරුවන්ගේ කාර්යභාර වැඩ පිළිවෙල යටතේ වගා දිරි දීමනා ක්ෂෙත්‍ර හරස් පරීක්ෂණ කරුණු වාර්තා කිරීම සඳහා උපයෝගී කරගත යුතු ආකෘතිය මේ සමග ඉදිරිපත් කරමි.

මා විසින් හඳුනා ගනු ලබන අවසර පත්‍ර වලට අදාලව හරස් පරීක්ෂණ, නම් කරනු ලැබූ නිලධාරීන් විසින්ම ඉටු කළයුතු අතර, ඊට අදාල වාර්තා පසු මාසයේ 10 දිනට ප්‍රථම අභ්‍යන්තර විගණක වෙත ලේඛන ගත තැපැලෙන් ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය කළමනාකරුගේ වගකීම වේ.

සියලු හරස් පරීක්ෂණ, වගා දිරි දීමනා ගොනු පරීක්ෂාවකින් තොරව ස්වාධීනව සිදු කළයුතු අතර, ඒ සඳහා පහසු වනු පිණිස ආකෘතියේ අංක 1 කරුණ යටතේ අදාල තොරතුරු ප්‍රාදේශීය කළමනාකරු විසින් හෝ ඒ පිළිබඳව ඔහුගේ ලිඛිත බලය ලත් අයෙකු විසින් සම්පූර්ණ කර ප්‍රාදේශීය කළමනාකරු මගින් අදාල පරීක්ෂණ නිලධාරියාට භාරදීම සිදුකල යුතුය.

ප්‍රාදේශීය මට්ටමෙන් හරස් පරීක්ෂණ සඳහා යොමු කිරීම සහ වාර්තා ලැබීම පිළිබඳ පාලනයක් පවත්වා ගැනීම සඳහා ලේඛනයක් නඩත්තු කළයුතු අතර, එහි එක් එක් පරීක්ෂණ නිලධාරියා වෙනුවෙන් පිටු වෙන්කර සටහන් යාවත්කාලීනව පවත්වා ගැනීම කළයුතු වේ. එම ලේඛනයේ ආකෘතිය පහත පරිදි සකස් කර ගත යුතුවේ.

පරීක්ෂණ නිලධාරියාගේ නම :

පරීක්ෂණ නිලධාරියාගේ තනතුර :

| අවසර පත්‍ර අංකය | පත්‍රිකා යොමු කල දිනය | පරීක්ෂණ පැවැත්වූ දිනය | වාර්තාව ලැබූ දිනය | ප්‍රධාන කාර්යාලයට යොමුකල දිනය |
|---|---|---|---|---|
| | | | | |

මෙහෙයුම් කරුවන්ගේ කාර්යභාරයට සමගාමීව මෙය විශේෂ වැඩ පිළිවෙලක් යටතේ සිදු කරනු ලබන පරීක්ෂණ වන අතර, එයට අමතරව සාමාන්‍ය ක්‍රමය යටතේ 1992.12.01 දිනැති අංක 39 දරණ චක්‍රලේඛ ලිපියෙන් හඳුන්වා දී ඇති පරිදි වගා දිරි දීමනා හරස් පරීක්ෂණ පැවැත්වීම කළ යුතුවේ.

(රෝහණ ඉලංගරත්න)
සභාපති

පිටපත්:

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( සංවර්ධන/ ව්‍යාප්ති)
2. සහකාර සාමාන්‍යාධිකාරී ( සංවර්ධන/ ව්‍යාප්ති/ පරිපාලන)
3. මුදල් කළමනාකරු
4. අභ්‍යන්තර විගණක - ප්‍රාදේශීය කාර්යාල වලින් ලැබෙන වාර්තා පිළිබඳව අවශ්‍ය විගණන කටයුතු කර මා වෙත වාර්තා කිරීමට.

I-Audit

118

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# මෙහෙයුම්කරුවන්ගේ කාර්යභාරයට අනුකූලව පවත්වනු ලබන
# ක්ෂේත්‍ර හරස් පරීක්ෂණ වාර්තාව

ප්‍රාදේශීය කාර්යාලය :

පරීක්ෂක තැනගේ නම :

තනතුර :

## 1. ඉඩම පිළිබඳ විස්තර

අවසර පත්‍ර අංකය :

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:

ග්‍රාම නිලධාරි වසම :

ගම :

ඉඩමේ නම :

මානක සැලසුම් අංකය හා

පිළියෙල කල දිනය :

* ඉඩමට ළඟා වියහැකි මාර්ගය :
* අයිතිකරුගේ නම සහ ලිපිනය

ඉඩමට අයත් මුළු බිම් ප්‍රමාණය

අවසර පත්‍රය ආවරණය වන බිම් ප්‍රමාණය :

2. අවසර පත්‍රය යටතේ නිමකර ඇති වැඩ අදියර හා බිම් ප්‍රමාණය :
( ✓ ලෙස දක්වන්න )

| වැඩ අදියර | බිම් ප්‍රමාණය | | | වැඩ නිමකල වර්ෂය/ මාසය |
|---|---|---|---|---|
| ☐ උදුරා දැමීම/ පස සංරක්ෂණය | අක්. | රූඩ්. | පර්. | |
| ☐ පස සාරවත් කිරීම | අක්. | රූඩ්. | පර්. | |
| ☐ තේ වගාව | අක්. | රූඩ්. | පර්. | |
| ☐ වගා කටයුතු කිසිවක් ආරම්භ කර නොමැත. | | | | |

3. ඉඩම, අදාල ආධාර ක්‍රමය යටතේ තේ වගාවට යෝග්‍යද ?

ඔබගේ නිරීක්ෂණ :

4. නිම කරන ලද වැඩ පිළිබඳ තත්ත්වය

(අ) එක් එක් වාරිකයට අදාල වැඩ කොටස් පිළිබඳව ඔබගේ නිරීක්ෂණ සවිස්තරව :
(විර්දේශිත ප්‍රමිතියට වඩා අඩු ප්‍රමිතියකින් යුක්ත නම් ඒ පිළිබඳ තොරතුරු සවිස්තරව දක්වන්න)

(ආ) නිගමන :

| | |
|---|---|
| උදුරා දැමීම / පස සංරක්ෂණය | ඉතා හොඳයි/ හොඳයි/ දුර්වලයි. |
| පස සාරවත් කිරීම | ඉතා හොඳයි/ හොඳයි/ දුර්වලයි. |
| තේ වගාව | ඉතා හොඳයි/ හොඳයි/ දුර්වලයි. |

5. නිම කරන ලද වගා කටයුතු නිසි පරිදි නඩත්තු කර තිබේද ?

(අ) එක් එක් වාරිකය පිළිබඳ ඔබගේ නිරීක්ෂණ සවිස්තරව :

(ආ) නිගමන :

| | |
|---|---|
| උදුරා දැමීම / පස සංරක්ෂණය | ඉතා හොඳයි/ හොඳයි/ දුර්වලයි. |
| පස සාරවත් කිරීම | ඉතා හොඳයි/ හොඳයි/ දුර්වලයි. |
| තේ වගාව | ඉතා හොඳයි/ හොඳයි/ දුර්වලයි. |

6. දැනටමත් කර ඇති ගෙවීම් හා ඒ පිළිබඳ ඔබගේ නිර්දේශ?

7. ඉදිරි ගෙවීම් සඳහා නිම කර ඇති වැඩ කොටස් හා ඒ පිළිබඳ ඔබගේ නිර්දේශ :

8. මෙම ඉඩමට අදාලව ලබාගෙන ඇති වෙනත් අවසර පත්‍ර පිළිබඳව

| අවසර පත්‍ර අංකය | බිම් ප්‍රමාණය |
|---|---|

9. වෙනත් කරුණු :

10. අදාල ඉඩම පෙන්වා දුන් අයිතිකරු/ වගාකරු/ නියෝජිත තැනගේ නම හා ලිපිනය :

ඉහත සඳහන් ඉඩම 19 ...................... දින මා හරස් පරීක්ෂණයට භාජනය කරන ලද අතර, ඒ අනුව ඉහත සහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

අත්සන : ..............................

නම : ..................................

දිනය : ..................

ප්‍රාදේශීය කළමනාකරුගේ සහටන :

ගොණුගත තොරතුරු හරස් පරීක්ෂණ වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති කරුණු සමග සැසඳේ./ පහත කරුණු වලට යටත්ව සැසඳේ.

1.
2.
3.

ප්‍රාදේශීය කළමනාකරුගේ අත්සන

නම :

දිනය : ....................